**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**
**பொலிஸ் ஊடகப் பிரிவு**
**POLICE MEDIA DIVISION**
**සුහුරුපාය, බත්තරමුල්ල**


තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1444 / 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 08/09/2024
පැය 1155

## මාධ්‍ය නිවේදනය

### 01. රත්‍රං බිස්කට් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කටුනායක ගුවන්තොටුපල ඒකකය.

2024.09.07 වන දින දහවල් කාලයේදී කටුනායක ගුවන්තොටුපල පිටවීමේ පර්යන්ත පරිශ්‍රයේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කටුනායක ගුවන්තොටුපල ඒකකය නිලධාරීන් විසින් **නීති විරෝධී ලෙස රැගෙන යාමට තැත් කල රත්‍රං ග්‍රෑම් 1158.5 ක් බරැති රත්‍රං බිස්කට් 09 ක් හා රත්‍රං බෝල 03 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වූ ඉන්දියන් ජාතිකයෙකි.**

සැකකරු අදාල දේපලද සමඟ වැඩිදුර විමර්ශන සඳහා රේගු නිලධාරින් වෙත භාර දීමට කටයුතු කර ඇත.

මීට අදාල ඡායාරූපයක් මේ සමඟ ඔබ වෙත එවමි.

### 02. නීති විරෝධීව මෙරටට රැගෙන එන ලද සිගරට් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය කටුනායක ගුවන්තොටුපල ඒකකය.

2024.09.08 වන දින අළුයම් කාලයේදී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය කටුනායක ගුවන්තොටුපල ඒකකයේ නිලධාරීන් විසින් වැටලීමක් සිදු කර ඩුබායි රාජ්‍යයේ සිට ගුවන් මඟින් **නීති විරෝධී ලෙස මෙරටට රැගෙන එන ලද සිගරට් 14,000 ක් (කාටුන් 70 ක්) සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වන මන්නාරම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**